# කඳුළු වේදනා



**නිමිත්ත**

මා නිතරම ඇවිදින්නට යන විට හමුවන
කෝල්ස් හන්දියේ නිතරම සිටින
ආදිවාසීන් ගැනයි මේ කවි පන්තිය

කෝල්ස්වකට හැරෙනා තැන	බංකු උඩ
නිදි කිරමින් සිටින අය වෙති	කඩින් කඩ
බාගෙට පියවී ඇස් හා ඇඳි	ගොමස් කඩ
මේ අය වෙත්ලු මෙරටේ සිටි	මුල්ම නඩ

ගස් යට සෙවණෙ බංකුව උඩ	දිග ඇද්දී
නෙත් දෙක යවයි අහසේ ඈතට	රැන්දී
අයදුම් කරති යන එන අය හට	පින් දී
කව්රුත් එතැන නොරැදෙයි ඔවුනට	කන් දී

කොණ්ඩය කපා නැත රැවුලත්	එලෙසමය
කලකින් නාපු බවවත් නොසිතිය	හැකි ය
බියර් කෑන් එක හැම විට	අතේම ය
සිගරැට්ටුව ද ගිණි නැති මුත් මුව	අග ය

එනමුත් ඔවුන් හට තිබුණිය මගේ	කියා
ගන්නට රටක් නෑ පිරිසක් සෙනේ	දයා
කව්දෝ ඇවිත් හද සොකෙන් පුරව	තියා
සොරකම් කළෝ නිදහස උන් අගුවෙ	තියා

අව්වට වැස්සට එක ලෙස පුරුදු	ඇතී
දිවි පෙවෙතක් මේ අය ගෙනියන්ට	ඇතී
ගමනට යාන වාහන කිසිවක්	නොමැතී
"පහුරු" පා ගමන් පිහිටට ගන්ට	ඇතී

රටක් කොල්ල කා වරිගය විසුණු	කළ
අය දැන් රජ කරති සමගින් සැප	බහුල
ආදි වාසි යයි කියනා මිනිස්	කැල
කාලය ගෙවති මතින් කරගෙන සිහි	විකල

යහතින් ඉදන් කියමින් සති දෙකට	වරක්
රජතුම ගෙවයි මොවුනට යැපුමට	පඩියක්
සිහිවන විට තම වරිගෙට සිදුවු	දෙයක්
හැකි වෙද ඉන්ට රදවාගෙන හොද	සිහියක්

**සිරිල් බී අලවතුර**
ක්වීන්ස්ලන්තය


Raigam

2006

සුබ නව වසරක් වේවා!

Wish you a Very Happy & Prosperous New Year !

මේ සුබ පැතුම්

THE KINGDOM OF RAIGAM®

21 වන සියවසේ දේශීය සමාගම

www.raigam.lk

Sri Lanka & E-Techno Enterprises Australia

රයිගම් නම් කවදත් කොතැනත් හරිම රසයි!

Wholesale & Customer Service 03-9700 2100 & 03-93703813 Fax: 03-9337 9468

Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, PO Box 87, VIC 3039
Email:sales@etechno.com.au


12 වන පිටෙන්

"ඇවිල්ල බලන්න මොන තරම් ලස්සන කූඩුවක්ද බල්තසාර් අපේ ළමයට හදල ගෙනැල්ලෙ තියෙන්නෙ කියල. "

ජෝසෙ මොන්ටියල් තුවායෙන් ඇග පිහිදන ගමන්ම එලියට කර පොවල බැලුව.

"මේ පේපෙ පුංචි මහත්තය හදල ඉල්ලපු කූඩුව." බල්තසාර් කිව්ව. මොන්ටියෙල් බිරිඳ ඔහු දිහා බැලුවෙ පුදු- මයෙන් වගේ." මොනව මගේ පුතා කිව්වද මේ වගේ කූඩුවක් හදන්න?"

මොහොතකින් පෙපේ පාසැල ඉවරවෙලා පිටිපස්සෙ දොර ඇරගෙන ගේ තුලට ආව. ඔහුගෙ වයස ඇවුරුදු දොලහක් විතර ඇති. ශෝකාකූල මුහුණත් සමග ඇගේ අගට හීනියට කැරලි ගැහුනු කෙස් ඇති ඇහි බැමිත් ඔහුට මවගෙන් උරුම වූ දේවල්.

"මෙහාට එනව. ඔයා කිව්වද බල්තසාර්ට මේ කූඩුව හදන්න කියල?" මොන්ටියෙල් මුහුනෙ රැඳුනේ දැඩි කෝපයක්.

බියටත් කලබලයටත් පත්වූ කූඩා ළමයා හිස පහත් කර ගත්තා. මොන්ටියෙල් හිස කෙස් ලමයා ගේ හිස කෙලින් කරවලා තමන් දෙසට හරවා ගත්තා.

"ගූටි නොකා උත්තර දෙනව මට."

ළමයා උත්තරයක් නොදී තමන්ගෙ තොල් සපාගෙන සිටියා.

මොන්ටියෙල් ළමයට යන්න ඇරල බල්තසාර දිහාට හැරුන. මිනිහගෙ මුහුනෙ දිගටම රැඳුනෙ කෝපයක්. "මට බොහොම කනගාටුයි බල්තසාර් තමුසෙට තිබුනෙ මේක හදන්න ඉස්සර මගෙනුත් අහන්න. මේක පොඩි එකා. එයාගෙ ඕඩරයක් මේ විදියට භාර ගන්න එක වැරදියි. අපි මේ ගැන හාංකාවිසියක් වත් දන්නෙ නැහැනෙ. "මිනිහ කූඩුව දිහා බලන්නෙවත් නැතිව ඒක බල්තසාර් අතට දුන්න. "මේක ආපහු අරන් යනව. අපට එපා........"

ළමයා එතැනට රැඳී හිටියෙ ගල් ගැහිල වගේ. ඔහු ඇහි පිහ ගැහුවෙත් නැහැ. ඊත් එක පාරටම මිනිහ බල්ලෙක් උඩු බුරලනව වගේ ශබ්දයක් නගමින් බිම පෙරලුනා. ඊට පස්සෙ කෑ ගහන්න පටන් ගත්ත.

ළමහගෙ අම්ම ඔහුව අස්වසන්නට තැත් කලත් මොන්ටියෙල් ඇයව වැලකුවා. "ඔහොම කෑ ගහල බෙල්ල කඩා ගත්තාදෙන්. එපා නැගිට්ටවන්න."

පණ අදින හාවෙක් දිහා බලන්න වගේ බල්තසාර් ළමය දිහා බලන් උන්න. වෙලාව හතර වේගනත් එනවා. මේ වෙලාවට වෙනකොට උර්සුලා රෑට උයන්න ලූනු කපනව ඇති" පරණ ගීතයක් ගයමින්.

"පෙපේ පුංචි මහත්තයෝ..".ඔහු ළමයාව ආදරයෙන් ඇමතුව. ඉන්පසු ඔහු වෙත ගමන් කළා. "මෙන්න ඔයාගෙ කූඩුව. තියා ගන්න "

"බල්තසාර්..... "මොන්ටියෙල් මෘදුව කීව. "මම තමුසෙට කලින්ම කිව්ව ඔය කෙහෙල් මල අරන් යන්න කියල.. "

" ඕක ආපහු දෙන්න ළමයෝ." ඔහුගෙ අම්මත් කිව්ව. එහෙත් පෙපේ කූඩුව ආදරයෙන් පපුවට තද කර ගෙන

"නෑ පුතා ඔයා ඕක තියා ගන්න." ඉන්පසු මොන- "ටියෙල් දෙසට හැරුනු ඔහු කිව්වෙ." මම මේ කූඩුව හැදුවෙ වෙන කෙනෙකුට දෙන්න නෙවෙයි. කමන් නැහැ."

මොන්ටියෙල් ආපසු යන බල්තසාර් පිටුපස සාලයේ කෙලවරටම ආව. "මෝඩ වෙන්න එපා මිනිහො. නිකං බහුබූත දොඩවන්නෙ නැතිව ඔන්න ඔය අටමගලෙ අරන් යනව. මම කොහොමටවත් ඕකට ශතයක් වත් ගෙවන්නෙ නැහැ."

කිසිත් නොදෙඩූ බල්තසාර් එලියට බැස සෙනග අතරට පිවිසුනා. මොන්ටියලේ සාලයේ සිට කෑ ගැසුව. මිනිහගෙ මූණ මලානික වෙලා....ඇස් රතු වෙන්න ලගයි....." මෝඩය මේක අරන් පලයන්. මේ ගෙදරට ගේන දෙව්ල් මොනවද කියල ඕඩර් කරන්නෙ මං විතරයි. බැල්ලිගෙ පුතා..ෟ.ආව මෙතැන කබල් කූඩුවක් එල්ල ගෙන. මට දොස්තරල කියල තියෙන්නෙ වැඩිය තරහ ගන්න එපා කියල. ඒ හින්ද මං මෙච්චරවත් ඉවසනව......"

මේ කිසිත් නොදත් එලියේ රැඳී සිටි පිරිස වෙතින් බල්තසාර්ට එල්ල වුනේ විශාල ප්‍රසාදයක්. ඔහු කල්පනා කළේ තමන්ට මිටත් වඩා අගනා කූඩුවක් අනාගතයේදී හැදිය හැකි බවයි. කූඩුව ලැබීම නිසා පෙපේ ගෙ හැඩීම නැවැත්වීමට හැකිවීම ගැන ඔහු සතුටු වුනා. සිදු වූ අන් කිසිඳු දෙයක් වැදගත් යැයි ඔහුට සිතුනේ නැහැ. එහෙත් ඒ සමගම ඔහුට සිතුනේ මිනිසුන්ට වැදගත් වන්නේ ඒ කාරණාව හැර අනිත් සියළු කාරණා බවයි. මෙයින් බල්තසාර් කලබලයටත් පත්වුනා.

"ඉතින් මොන්ටියෙල් මහත්තය බල්තසාර් අය්යට දුන්නද කූඩුවට පේසො පනහක්? "කට්ටිය ඇහැව්ව. "පනහක් නෙවෙයි. හැටක් දුන්න." බල්තසාර්ට කියැ- වුනා.

"එච්චර ලොකු ගාණක් ඔය කූණු පෙරේතය ගත්ත කියන්නෙ ලොකු දෙයක්. අපි ඕක සමරන්න ඕනි මහ ඉහලින්. "එකෙක් ඉල්ලා සිටියා. හැමෝම ඒක අනුමත කළා. කට්ටියම ගියා බාර් එකට. එකෙක් මිනිහට බීර වීදුරුවක් ගෙනාව. ඊට පස්සෙ බලතසාර් කට්ටියටම දෙපාරක් මත්පැන් ඇනවුම් කළා. ඔහු මේ විදියට බිව්වෙ ජීවිතේ පළමු වතාවට. ඊට පස්සෙ ඔහු පිරිසට කිව්වෙ අර වගේ කූඩු දාහක් හැදීමට තමන් අදහස් කරන බවයි. "එකක් මං විකුණන්නෙ පේසො හැට ගානෙ. ඊට පස්සෙ මං කූඩු ලක්ෂයක් හදනව. ඔය පො- හොසත් මිනිස්සු මැරෙන්න කලින් හැම දේම හදල උන්ට විකුණන්න ඕනි....." මිනිහ බීල හොඳටම දෙඩෙව්ව.

"ඔය පොහොසත් මිනිස්සු ඔක්කොම ලෙඩ්ඩු. ඒ ඔක්කොම මැරෙන්න යන්නෙ. ඒ ගොල්ලො කොච්චර දුර්වල ද කියනවනං දොස්තරල කියල තියෙන්නෙ ඕනැවට වැඩිය තරහ ගන්නත් එපාය කියලලු......"

පැය දෙකක් විතර බල්තසාර් කැසිනෝ මැෂින් එකේ සෙල්ලං කරල හුගක් සල්ලි නාස්ති කළා. එයාගෙන් බීපු මිනිස්සු ඔහුට යහපත් සෞඛ්‍යත් පොහොසතුන්ට මරණයත් ප්‍රාර්ථනා කළා. ඊත් රාත්‍රි කෑම වෙලාව වෙන- කොට හැමෝම මිනිහ දාල ගිහින්. කෙනෙක් ඇවිල්ල උර්සුලාට කිව්ව බල්තසාර් බීල වැටිල ඉන්නව කියල. ඊත් තමන්ගෙ සැමිය නොබොන කෙනෙක් හින්ද ඇය ඒ කතාවට වගකට ගත්තෙ නැහැ. ඇය දොර වසා ගෙන නිදා ගන්න ගියා.

බල්තසාර් කවදාවත් නැති ප්‍රීතියකින් විදුලි පහන් දැල්වූ නාමර්යක සුව යහනක නිදා ගෙන හිටිහා වගේ දැනුන. කොරවක්කූ ඔහුගේ ඇගමතිනුත් පනිමින් එහෙ මෙහෙ ඇවිද ගියා. මිනිහගෙ මූණ පුරා විවිධ දෙවල් තැවරිලා. තවදුරටත් ඉදිරියට පා නගන්න බැරි වුනත් මිනිහට හිතිල තිබුනෙ එකම ඇඳක ගෑනු දෙන්නෙක් එක්කම නිදා ගන්න. මිනිහ කොච්චර වියදම් කරල තියෙනවද කිව්වොත් ඔරලෝසුවත් උගස් තියල පහුවදා බේර ගන්න පොරොන්දුව පිට.

ටික වෙලාවකට පස්සෙ මිනිහ එක පාරටම ගෙවල් අතට දුවන්න ගත්ත.

එතකොට තමයි මිනිහට තේරුනේ කවුරු හරි තමන්ගෙ සපත්තු කූට්ටමටත් විදල කියල. ඊත් ඔහුට තමන්ගෙ ප්‍රීතිමත් දිනය අතහැරල දාන්න හිතක් තිබුනෙ නැහැ. හවස දේව මෙහෙයට සහභාගි වෙලා එන ගැහැණු හොඳටම බය වුනා මේ නං එන්නෙ මළමිනියක් තමයි කියල.

-නිමි-


**Professional Tutoring/Coaching**
Focus on both Individual and Groups sessions

**Subjects Offered**
- Specialist Mathematics
- Mathematical Methods
- Further Mathematics
- Mathematics For IB curriculum
- Mathematics (Years 5-10)
- Physics (VCE/ IB)
- Chemistry (VCE/ IB)
- Biology Accounting IT

**Our Specialties**
- Excellent coaching for both VCE and IB curriculum
- Finishing the VCE/IB curriculum as early as possible
- More and more Trial Exams/ Past exams papers, aiming towards a proper examination preparation
- White board teaching when essential

**Conducted by**
Athil Goonesekera
ATA Professional Solutions
17A Dunstan Street Macleod Tel: 94569714
Mobile: 0433113836
Email: athil_g@bigpond.net.au

ශ්‍රී ලාංකික ප්‍රජාවගෙන් අයකෙරෙන මුදලින් 5% ප්‍රමාණයක් අප මව් රටේ දක්ෂතා ඇති දුප්පත් ළමුන්ගේ මාසික අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා බැර කරනු ලැබේ.